# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,243 - 2021 අගෝස්තු මස 27 වැනි සිකුරාදා - 2021.08.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1252 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1256 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 සැප්තැම්බර් මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1251 - B 82264 — 5,403 (2021/08)

# පළාත් පාලන නිවේදන

## මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂයේ ජනවාරි මස 28 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 175 යටතේ සභාව සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් ලෙස කටයුතු කරන එම්. පී. ඩී. පී. ජයසිංහ වන මා විසින් අනුමැතිය දෙනු ලැබූ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. ඩී. පී. ජයසිංහ,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය.

2021 මාර්තු මස 22 වැනි දින,
අනුරාධපුර පළාත් පාලන කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1987 අංක 15 දරන සභා පනතේ 134 (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සිතියමෙන් සහ උපලේඛනයෙන් විස්තර කරන ප්‍රදේශය සඳහා උපරිම මට්ටමින් සේවා ව්‍යාප්ත කිරීමට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින් දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවත්,


02. එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට අනුරාධපුර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවටත් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය (ඇ) පණ්ඩුලගම**

මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 293 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අයත් වන්නා වූ ද,

| | | |
|---|---|---|
| උතුරට | : | ඔප්පු අංක/ලොට් අංක/ඔප්පු අංක 515 පත්‍ර අංක 03 හි 13, 14 දරන දේපළ වලින් ද, |
| නැගෙනහිරට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක 515 පත්‍ර අංක 03 හි 67, 164 දරන දේපළ වලින් ද, |
| දකුණට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක 515 පත්‍ර අංක 05 හි 281 දරන දේපළ වලින් ද, |
| බස්නාහිරට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක 515 පත්‍ර අංක 4 හි 226 දරන දේපළ වලින් ද, |

**මායිම් පිළිබඳ උපලේඛනය (ඇ)**




| Place | Name |
|---|---|
| A | Garment |
| B | Temple |
| C | Divisional Secretarial Office |
| D | Pradesheeya Sabha Office |


| Id | X | Y |
|---|---|---|
| 1 | 80.36 | 8.33 |
| 2 | 80.37 | 8.33 |
| 3 | 80.37 | 8.33 |
| 4 | 80.37 | 8.33 |
| 5 | 80.37 | 8.34 |
| 6 | 80.37 | 8.33 |
| 7 | 80.36 | 8.33 |
| 8 | 80.36 | 8.33 |
| 9 | 80.36 | 8.33 |

**උපලේඛනය (ඇ) පේමඩුව**

මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 362 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අයත් වන්නා වූ ද,

| | | |
|---|---|---|
| උතුරට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක FCP/ අ.2 - 1 247 දරන දේපළ වලින් ද, |
| නැගෙනහිරට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක FCP/ අ.2 - 1 409 දරන දේපළ වලින් ද, |
| දකුණට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක FCP/ අ.2 - 1 442 දරන දේපළ වලින් ද, |
| බස්නාහිරට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක FCP/ අ.2 - 1 345 දරන දේපළ වලින් ද, |

**මායිම් පිළිබඳ උපලේඛනය (ඇ)**




**උපලේඛනය (ඇ) ඇලයපත්තුව**

මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 362 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට අයත් වන්නා වූ ද,

| | | |
|---|---|---|
| උතුරට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක FVP/ 704 ඇලයාලපත්තුව 152 දරන දේපළ වලින් ද, |
| නැගෙනහිරට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක FVP/ 704 ඇලයාලපත්තුව 132 දරන දේපළ වලින් ද, |
| දකුණට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක FVP/ 704 ඇලයාලපත්තුව 93 දරන දේපළ වලින් ද, |
| බස්නාහිරට | : | පිඹුරු පත්/ලොට් අංක/ඔප්පු අංක FVP/ 704 ඇලයාලපත්තුව 89 දරන දේපළ වලින් ද |

**මායිම් පිළිබඳ උපලේඛනය (ඇ)**




08 - 340

# විවිධ දැන්වීම්

සංශෝධනයයි

**මොරටුව මහ නගර සභාව**

2020.12.24 වැනි දින පළ වූ අංක 2208 *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටස - පළාත් පාලනය තුළ මොරටුව මහ නගර සභාව 2021 වර්ෂයට බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම යටතේ උපලේඛන අංක 1 හි බලපත්‍ර ගාස්තු අය කිරීම තුළ අනු අංක 138 පහත පරිදි සංශෝධනය විය යුතුය ෑ

**මොරටුව මහ නගර සභාව**

2021 වර්ෂයට බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම

1979 අංක 42 දරන සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතින් මොරටුව මහ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2020.11.05 වැනි දින මාසික සභා රැස්වීමේදී අංක 6 (9) 14 යටතේ පනවන ලද බදු පැනවීම 2021.05.18 වැනි දින මාසික මහා සභා රැස්වීමේ අංක 6 (09) 23 යටතේ පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු,
නගරාධිපති.

2021 අගෝස්තු මස 09 වැනි දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1979 අංක 42 දරන සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1947 අංක 29 දරන මහ නගර සභා ආඥපනතේ (252 වැනි අධිකාරිය) 247 "අ" ප්‍රකාරව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන සෑම මාළු හෝ මස් වෙළඳාමක් ම උපලේඛන අංක 1 පරිදි බලපත්‍ර ගාස්තුවක් අයකළ යුතුයැයි යෝජනා කරන්නීය.

**මොරටුව මහ නගර සභාව**

2021 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

**උපලේඛනය අංක 1**

බලපත්‍ර ගාස්තු අය කිරීම - 247 (අ) වගන්තිය

| *බලපත්‍ර ගාස්තු වක්‍රය ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම* | *බලපත්‍ර ගාස්තු රු. ශත* |
|---|---|
| රු. 100 - රු. 6,500 | 700 0 |
| රු. 6,501 - රු. 10,000 | 1,500 0 |
| රු. 10,001 - රු. 25,000 | 3,000 0 |
| රු. 25,000ට වැඩි | 5,000 0 |

ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අය කරනු ලැබේ.

| *අනු අංකය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* |
|---|---|
| 138 | මාළු හෝ මස් වෙළඳාමක් |

08 - 342

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.